# රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
# பதிவாளர் நாயகம் திணைக்களம்
# REGISTRAR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. RG/MBD/1/81

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
HEAD OFFICE

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. 565

ඔබේ අංකය / உமது இல. / Your No.

234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
234/A3, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை.
234/A3, Denzil Kobbakaduwa Mawatha, Battaramulla.

දිනය / திகதி / Date 2023.07.26


චක්‍රලේඛ අංකය : 04/2023

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්/ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් මගින්,

අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් මගින්,

සියලුම වෛද්‍ය රෙජිස්ට්‍රාර්වරුන් සහ උප්පැන්න හා මරණ කොට්ඨාස රෙජිස්ට්‍රාර්වරුන් වෙත,

**<u>ආදාහනාගාර/ සුසානභූමි වෙන් කිරීම සඳහා සහතික නිකුත් කිරීම.</u>**

ඉහත කරුණ සම්බන්ධයෙන් සියලුම පළාත් පාලන ආයතන කොමසාරිස්වරුන් අමතන ලද මාගේ අංක M/10/විවිධ/පොදු/ම.ස./04/2014 හා 2014/06/18 දිනැති ලිපිය මගින් ලබාදුන් උපදෙස් වෙනුවට 2023.07.01 වන දින සිට මෙම චක්‍රලේඛය බලපැවැත්වෙන බව මෙයින් දන්වමි.

02. ඉහත සඳහන් උපදෙස් ලිපිය අනුව ආදාහනාගාර /සුසානභූමි වෙන් කිරීමේදී බී18, බී16 හා බී 20 ආකෘති පත්‍ර මගින් ඉදිරිපත් වන සහතික භාරගෙන ආදාහනාගාර/ සුසානභූමි වෙන් කිරීමට පියවර ගන්නා ලෙස සියලුම පළාත් පාලන ආයතන හා සුසානභූමි පාලකවරුන් දැනුවත් කර ඇත.

03. මෙම දැනුවත් කිරීම නිසා වෛද්‍ය රෙජිස්ට්‍රාර්වරුන් සහ උප්පැන්න මරණ රෙජිස්ට්‍රාර්වරුන් විසින් බී 16 හා බී 20 ආකෘතිපත්‍ර මගින් සහතික නිකුත් කිරීමේදී එකී ආකෘතිපත්‍ර මත මෘත ශරීරය ආදාහනය කරන්නේද නැතහොත් භූමදානය කරන්නේද යන්න පිළිබඳව සටහන් කර ඉදිරිපත් කරන ලෙසට පළාත් පාලන ආයතන විසින් ඉල්ලා සිටීම නිසා රෙජිස්ට්‍රාර්වරුන් විසින් මෙම ආකෘති වල අමතර සටහනක් ලෙස අදාළ මෘත ශරීරය ආදාහනය කිරීම හෝ භූමදානය කිරීම සම්බන්ධයෙන් සටහන් යෙදීමට කටයුතු කරන බව නිරීක්ෂණය වේ.

04. මරණ පරීක්ෂකතැන විසින් නිකුත් කරනු ලබන බී 18 ආකෘතියෙහි මෘත ශරීරය භූමදානය කළ යුතුද,ආදාහනය කළ යුතු ද යන්න සටහන් කිරීමක් සිදු වන අතර මරණ පරීක්ෂකවරුන්ට එකී තීරණය ලබාදීමේ බලයද ඇත.

05. නමුත් බී 16 හා බී 20 ආකෘතිපත්‍ර වල සඳහන් කරුණු වලට අමතරව මෘත ශරීරය ආදාහනය කිරීම හෝ භූමදානය කිරීමට තීරණය කර ඒ බවට සටහන් කිරීමේ නීත්‍යානුකූල බලයක් වෛද්‍ය රෙජිස්ට්‍රාර්වරුන් සහ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර්වරුන් වෙත ලබා දී නොමැත. එබැවින් මින් ඉදිරියට නීත්‍යානුකූල නොවන කිසිදු සටහනක් බී 16 හෝ බී 20 ආකෘතිපත්‍ර වල යෙදීමෙන් වළකින ලෙස මෙයින් දන්වා සිටිමි.

06. බී 18, බී 16, බී 20 යන ආකෘති පත්‍ර වලට අමතරව බී 12 මරණයට හේතු දැක්වෙන වෛද්‍ය සහතිකය, බී 19 වතු අධිකාරීවරයාගේ සහතිකය, බී 17 පොලිස් නිලධාරී/ග්‍රාම නිලධාරී සහතිකය ද පිළිගෙන ආදාහනාගාර/ සුසානභූමි වෙන් කිරීමට පියවර ගන්නා ලෙස පළාත් පාලන කොමසාරිස්වරුන් දැනුවත් කර ඇති බව දන්වා සිටිමි.


දුරකථන අංකය / தொலைபேசி இல. / Telephone No. 2889488, 2889489

ෆැක්ස් අංකය / தொலைநகல் / Fax No. 2889491

වෙබ් අඩවිය / இணையத்தளம் / Website www.rgd.gov.lk

විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail rgd@sltnet.lk, rg@rgd.gov.lk

06. මෙම චක්‍රලේඛ උපදෙස් නිසිව ක්‍රියාත්මක කිරීමට ඔබ විසින් කටයුතු කළ යුතු අතර, මේ සම්බන්ධයෙන් ඔබ විසින් දක්වනු ලබන සහයෝගය වඩාත් අගය කරමි.

ඩබ්.ආර්.ජී.එන්.එස්. විජයසිංහ

රෙජිස්ට්‍රාර් ජනරාල්

ඩබ්.ආර්.ජී.එන්.එස්. විජයසිංහ
රෙජිස්ට්‍රාර් ජනරාල්
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
නො. 234/ඒ3, ඩෙන්සිල් [illegible] මාවත,
කොස්වත්ත, බත්තරමුල්ල.

පිටපත :

01.ලේකම් - කරු. දැ.ගැ.ස.

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

02.සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් - කරු. දැ.ගැ.ස. හා අ.ක.ස.

03.සියලුම නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් - කරු. දැ.ගැ.ස. හා අ.ක.ස.

04.සියලුම දිස්ත්‍රික්භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් - කරු. . දැ.ගැ.ස. හා අ.ක.ස.

05.සියලුම පළාත් පාලන ආයතන ප්‍රධානීන්/ ලේකම්වරුන් වෙත - කරු. . දැ.ගැ.ස. හා අ.ක.ස.